# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,878/2 — 1969 නොවැම්බර් 2 වැනි ඉරිද — 1969.11.2**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී. 22/69.

**1968 අංක 30 දරන නින්දගම් පනත**

1968 අංක 30 දරන නින්දගම් පනතේ 6, 7, 20 සහ 26 දරන වගන්ති වලින් තමාට පැවරුණු බල තල යටතේ ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමතිවරයා විසින් සම්පාදිත නියෝග.

සි. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමති.

1969 නොවැම්බර් මස 2 වැනි දින
කොළඹ දීය.

නියෝග

1. මේ නියෝග 1969 (අංක 1 දරන) නින්දගම් ඉඩම් නියෝග යනුවෙන් හඳුන්වනු ලැබිය හැක.

2. (1) පනතේ 6(1) වගන්තිය යටතේ හිමිකම් කියා සිටීමේ යම් ලිඛිත ඉල්ලුම් පතක් ඉදිරිපත් කිරීම සඳහා නියමිත කාල සීමාව, නියමිත දින සිට, පොය දිනයන් හා නිවාඩු දිනයන් හැර, දින 90 ක කාල සීමාවක් විය යුතුය.

(2) හිමිකම් කියා සිටීමේ සෑම ලිඛිත ඉල්ලුම් පතක්ම හිමිකම් කියා සිටින්නා වූ නින්දගම් ඉඩම පිහිටි පාලන දිස්ත්‍රික්කයේ නියම බලධාරියාගේ මාර්ගයෙන් නින්දගම් ඉඩම් මණ්ඩලය වෙත යැවිය යුතුය.

3. (1) හිමිකම් කියා සිටීමේ සෑම ලිඛිත ඉල්ලුම් පතක්ම මෙයට අනුබද්ධ පළමුවන උප ලේඛනයේ දැක්වෙන "අ" ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද්දක් විය යුතු අතර එහි අසා ඇති තොරතුරු එහි ඇතුළත්විය යුතුය. එය පිටපත් දෙකකින් යුක්තව නියම බලධාරියා වෙත යැවිය යුතුය.

(2) හිමිකම් කියා සිටීමේ සෑම ලිඛිත ඉල්ලුම් පතක්ම සාමාන්‍ය වශයෙන් හිමිකම් කියන්නා විසින් තමා වෙනුවෙන් ඉදිරිපත් කළ යුතුය.

4. (1) අඩු වයස්කාර හෝ සිහි විකල හෝ අයකු වෙනුවෙන් හිමිකම් කියා සිටීමේ ලිඛිත ඉල්ලුම් පතක් ඉදිරිපත් කළ යුත්තේ උසාවියක් මගින් පත් කරන ලද ආරක්ෂකයකු හෝ කළමනාකරුවකු හෝ විසිනි. එවැනි පත් කිරීමක් උසාවියක් මගින් නොකරන ලද අවස්ථාවකදී එය ඉදිරිපත් කළ යුත්තේ නියම බලධාරියා විසින් අවශ්‍ය යයි සැලකෙන අන්දමක විභාගයක් පවත්වා එම කාර්‍ය සඳහා ඔහු විසින් පත් කරන ලද ආරක්ෂකයකු හෝ කළමනාකරයකු හෝ විසිනි.

(2) සිය කැමැත්ත අනුව හෝ ඒ ගැන සැලකිල්ලක් දක්වන යමකුගේ ඉල්ලීම පිට හෝ එබඳු පත් කිරීමක් නියම බලධාරියාට කළ හැක.

(3) එබඳු පත් කිරීමක් කළ වහාම නියම බලධාරියා විසින් හිමිකම් කියා සිටීමේ ලිඛිත ඉල්ලුම් පතේ සඳහන් වන නින්දගම් ඉඩම පිහිටි ප්‍රදේශයේ අධිකරණ බලය දරන ප්‍රදේශ විනිශ්චයකරු වෙත පිටපත් දෙකකින් යුත් වාර්තාවක් යැවිය යුතුය. එකී වාර්තාවෙහි ඔහු විසින් තබන ලද අත්සන සහ දිනය තිබිය යුතු අතර පහත සඳහන් කරුණුද එහි අඩංගු විය යුතුය:—

(අ) හිමිකම් කියා සිටීමේ ලිඛිත ඉල්ලුම් පත පිළිබඳ විස්තර;

(ආ) හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පත ඉදිරිපත් කර ඇත්තේ යම් අඩු වයස්කාරයකු හෝ සිහි විකල තැනැත්තකු වෙනුවෙන් ද ඔහුගේ සම්පූර්ණ නම සහ ලිපිනය;

(ඇ) ආරක්ෂකයකු හෝ කළමනාකරුවකු හෝ වශයෙන් පත් කරන ලද අයගේ සම්පූර්ණ නම සහ ලිපිනය;

(ඈ) පත් කළ දිනය;

(ඉ) පත් කිරීමට හේතුව.

(4) එම වාර්තාව ලැබුණු විට ආඥාවක් මගින් එම පත්වීම ස්ථිර කිරීම හෝ, එය අවලංගු කොට වෙන අයකු පත් කිරීම හෝ ප්‍රදේශ විනිශ්චයකරු විසින් කළ හැක. ඔහු විසින් පත්වීම ස්ථිර කළහොත් එම පත්වීම නියම බලධාරියා විසින් දුන් දිනයේ සිට වලංගු විය යුතුය.

(5) ප්‍රදේශ විනිශ්චයකරු විසින් පත්වීම අනුමත කිරීමට හෝ අවලංගු කිරීමට හෝ පෙර නියම බලධාරියා හෝ නියම බලධාරියා විසින් පත් කරන ලද ආරක්ෂකයකු හෝ කළමනාකරුහෝ අඩු වයස්කාරයා හෝ සිහි විකල අය හෝ වෙනයම් අයකු හෝ තමා ඉදිරියේ පෙනී සිටින ලෙස එම අයට නියම කිරීම අවශ්‍යනැත.

(6) ප්‍රදේශ විනිශ්චය කරු විසින් ස්වකීය ආඥාව සහතික පිටපත් දෙකෙහිම සටහන් කොට පිටපත් දෙකකින් එකක් ස්වකීය අධිකරණයේ ගොනු ගත කර අනෙක් පිටපත නියම බලධාරියාට ආපසු යැවිය යුතුය. නියම බලධාරියා විසින්, එසේ ආපසු ලැබුණු සහතික පිටපත ඒ හා අදාළ හිමිකම් කියා සිටීමේ ලිඛිත ඉල්ලුම් පතට ඇමිණිය යුතුය. එවිට එම පත් වීම, පනත යටතේ හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පත පිළිබඳව සහ අයිතිය පිළිබඳව තීන්දුවක් දීමේ කාර්යය සම්බන්ධයෙන් නීතිය අනුව වලංගු සහ බල සහිත විය යුතුය.

(5) (1) නියමිත කාලසීමාව තුළ හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පතක් ලැබුණු විට ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරියා විසින් අනුමත කරන ලද ප්‍රකාර දැන්වීමක් නියම බලධාරියා විසින් එකී ඉල්ලුම් පතෙන් හිමිකම් කියන ඉඩමේ ප්‍රදර්ශනය කරන්නට සලස්වා එම හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පතේ සඳහන් කර ඇති කරුණුවල නිරවද්‍යතාව ගැන ඊට අදළ ප්‍රාදේශීය ආදායම් නිලධාරියාගේ මාර්ගයෙන් එම ඉල්ලුම් පතේ සඳහන් කර ඇති ඉඩම පිහිටි කොට්ඨාශයේ ග්‍රාම සේවකයාගෙන් වාර්තාවක් ලබා ගත යුතුය.

(2) හිමිකම් කියා සිටීමේ ලිඛිත අයදුම් පතක් යොමු කරනු ලැබූ ග්‍රාම සේවක විසින්, දම්වැලට අහලේ මිනුම් සිතියමෙන් හෝ පිළිගත හැකි ආණ්ඩුවේ වෙනත් පිඹුරකින් හෝ, එම ඉල්ලුම් පතේ සඳහන් වන ඉඩමේ කටු සටහනක් නොහොත් පිටලස් රූප සටහනක් පිළියෙළ කොට ඒ පිළිබඳව දැනගත හැකිව තිබෙන විස්තර එහි ඇතුළත් කොට ඒ කටු සටහන හෝ පිටලස් රූප සටහන තම වාර්තාවට ඇමිණිය යුතුය.

(3) එම නින්දගම් ඉඩමට හිමිකම් කියන වෙනත් අයගේ නම් සහ ලිපිනයන් ද දැනගත හැකි තරමින් ග්‍රාම සේවකගේ වාර්තාවෙහි සඳහන් විය යුතුය.

(4) ග්‍රාම සේවකගේ වාර්තාව ප්‍රාදේශීය ආදායම් නිලධාරියාගෙන් ලැබුණු විට නියම බලධාරියා රාජකාරි බද්ද ලේඛනයේ දක්වෙන පරිදි ඒ නින්දගම් ඉඩම පිළිබඳව උධෘතයක් පිළියෙළ කරවා එය තමාම සහතික කළ යුතුය. නැතහොත් විධිවූ පරිදි ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවිය යුතුය.

(5) ඉක්බිති නියම බලධාරියා විසින් ග්‍රාම සේවකගේ වාර්තාව ද, මිනුම් සිතියමෙන් පිටලස් රූප සටහන හෝ කටු සටහන ද, රාජකාරි බද්ද ලේඛන යෙන් ගෙන සහතික කළ උධෘතය ද, අදළ සියලුම ලිපි ලේඛන ද, සහිතව එම හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පත ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුය.

6. (1) ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරියා එම හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පත සහ ඊට අදළ ලියකියවිලිත් හොඳින් පරීක්ෂා කොට සියලුම අදළ තොරතුරු, විස්තර යනාදිය සපයා ඇති බවට සෑහීමට පත් වීමෙන් පසුව, පනතේ 21 වන වගන්තිය යටතේ එම ඉඩමේ අයිතිය පිළිබඳව තීන්දුවක් දීම සඳහා එය නින්දගම් ඉඩම් කාර්‍යාලය වෙත යැවිය යුතුය.

(2) නින්දගම් ඉඩම හෝ ඉන් කොටසක් හෝ මැනීම අවශ්‍ය යයි ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරියා සිතතොත්, හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පත කාර්‍යාලය වෙත එසේ යවන්නට පෙර ඔහු ඒ ඉඩම මැනීමට නිල කළ යුතුය.

(3) එවැනි මැනීමේ වියදම පළමුව ආණ්ඩුව විසින් දැරිය යුතුය. එහෙත් අක්කරයකට රුපියල් පහළොවට වැඩි නොවන පරිදි එම මැනුම් වියදම් වලින් කොටසක් හිමිකම් කියා සිටින අයගෙන් අය කර ගත යුතුය.

7. (1) 6 වැනි නියෝගයෙහි සඳහන් මැනීම කළ යුත්තේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් හෝ විධානයන් යටතේ නිල කිරීමේ ලියවිල්ලක් පිට මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ උපදෙස් යටතේ ක්‍රියා කරන බල පත්‍ර ලත් මිනින්දෝරුවකු විසිනි.

(2) මැනීම සඳහා නිල කිරීමේ ලියවිල්ල නිකුත් කළ යුත්තේ ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරියා විසින් නියම කරනු ලබන ආකෘති පත්‍රයේ අන්දමටය.

(3) මෙම නිල කිරීමේ ලියවිල්ල නිකුත් කිරීමට පෙර, එම මැනිය යුතු ඉඩම වෙනුවෙන් අක්කරයකට හෝ අක්කරයකින් ඉතිරිවන කොටසක හෝ රුපියල් දෙකකුත් ශත පණහකට වැඩි නොවන පරිදි ගණන් බැලූ මුදලක් හිමිකම් කියා සිටින ඉල්ලුම් පත ඉදිරිපත් කර ඇති අයගෙන් තැන්පත් මුදලක් වශයෙන් නියම බලධාරියා විසින් ලබා ගත යුතුය. පසුව මෙම තැන්පත් මුදල 6 වැනි නියෝගයෙහි සඳහන් කැරුණු ගාස්තුවෙන් අඩු කළ යුතුය.

(4) මැනීම නිල කිරීමේ ලියවිලි පිටපත් දෙකක් කොමසාරිස් වෙත යැවිය යුතුය. එක් පිටපතක් මැනිය යුතු ඉඩමේ ප්‍රදර්ශනය කර තිබිය යුතුය. තවත් පිටපතක් හිමිකම් කියා සිටින ඉල්ලුම් පත ඉදිරිපත් කළ අයගේ දැන ගැනීම සඳහා ඔහු වෙත යැවිය යුතුය.

8. (1) ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරියා හෝ නින්දගම් ඉඩම් මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ නියම බලධාරියා හෝ කොමසාරිස් හෝ ග්‍රාම සේවක හෝ ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරියා විසින් නැතහොත් නියම බලධාරියා විසින් විධි වූ පරිදි බලය පවරන ලද යම් නිලධාරියකු හෝ විසින් ලිඛිත හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පතක් ඉදිරිපත් කර තිබෙන ඕනෑම ඉඩමකට එසේ නැත්නම් මැනීම නිල කර ඇති ඕනෑම ඉඩමකට හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පත සම්බන්ධ වූ ඕනෑම කාර්යයක් සඳහා හිරු උදවත් හිරු බැසීමත් අතර කාලයතුළ ඇතුලු වීම නීත්‍යානුකූල වන්නේය.

(2) මැනීම නිල කිරීමේ ලියවිල්ලෙහි පිටපතක් ඉඩමෙහි ප්‍රදර්ශනය කළ පසු යම් යම් අවශ්‍ය පුද්ගලයන්, උපකරණ, ද්‍රව්‍ය, වාහන සහ සතුන් ද සමඟ ඉඩමට ඇතුලු වී—

(අ) ඉඩම මැන එහි මට්ටම ගැනීමට ද ;

(ආ) ඉඩමේ යටි පස හැරීමට හෝ විදීමට ද ;

(ඇ) එම ඉඩමේ මායිම් දක්වීමට සහ ඉඩමේ කිරීමට අදහස් කරන ඕනෑම වැඩක මිනුම් රේඛාව දක්වීමට ද ;

(ඈ) ලකුණු කිරීමෙන් හා කාණු කැපීමෙන් එවැනි මායිම්, මට්ටම් හා මිනුම් රේඛා සලකුණු කිරීමට ද ;

(ඉ) එම ඉඩමෙහි තිබෙන වැව්ලිවලින්, වැට කටුවලින් නැතහොත් කැලයෙන් යම් කොටසක් කපා හෙලා එළි පෙහෙළි කොට මිස එසේ නැතිව එම ඉඩම මැන සම්පූර්ණ කිරීමටත්, මට්ටම් ගැනීමටත්, මායිම් සහ රේඛාව ලකුණු කිරීමටත් නොහැකි අවස්ථාවන්හිදී ඒවා කපා එළි පෙහෙළි කිරීමට ද ;

(ඊ) ඉඩම මැන ඉම් ගල් පිහිටුවීමට අවශ්‍ය වෙනත් සියලුම කටයුතු කිරීමට ද ;

නිල කරනු ලැබූ කොමසාරිස්ට හෝ ඔහුගේ බලය පිට ක්‍රියා කරන ඕනෑම අයකුට පුලුවන.

එතකුදු වුවත් තමා එම ඉඩමට ඇතුලු වීමට අදහස් කරන බව යටත් පිරිසෙයින් සම්පූර්ණ දින හතකටවත් කලින් ඉඩම භුක්ති විඳින්නාට දැනුම් දී මිස, ඉහත සඳහන් බලතල ක්‍රියාවේ යෙදවීමේදී, නිල කරනු ලැබූ කොමසාරිස් හෝ එකී කොමසාරිස්ගේ බලය පිට ක්‍රියා කරන තැනැත්තා හෝ එබඳු කිසිදු ඉඩමකට ඇතුලු නොවිය යුතුය.

(3) නිල කරනු ලැබූ කොමසාරිස් සර්වේයර් ජනරාල් හෝ ඔහුගේ නිලධාරීයෙක් නම්, ඔහු ඉඩම මන්නවා, මායිම්වල ඉම් ගල් තබවා, පිඹුරෙහි අවශ්‍ය පිටපත් ගණන පිළියෙළ කරවා මැනීමට නිල කළ නිලධාරියාට ඒවා යැවීමට සැලැස්විය යුතුය.

(4) නිල කරනු ලැබූ කොමසාරිස්වරයා බල පත්‍ර ලත් මිනින්දෝරුවෙක් නම් මැනීමට නිල කිරීමේ ලියවිල්ලේ පිටපත් දෙක තමාට ලැබුණු විට ඔහු ඒවා මැනිය යුතු ඉඩම පිහිටි ප්‍රදේශයේ මිනින්දෝරු අධිකාරීට යවා, ඔහුගෙන් අවශ්‍ය උපදෙස් ලබා ගත යුතුය. එම මිනින්දෝරු අධිකාරී අයථා ප්‍රමාද යක් නොමැතිව එකී නිල කරනු ලැබූ කොමසාරිස් වෙත උපදෙස් නිකුත් කරමින් නිල කිරීමේ ලියවිල්ලේ එක පිටපතක් ආපසු ඔහු වෙත යැවිය යුතුය.

(5) ඉක්බිතිව එම නිල කරනු ලැබූ කොමසාරිස්වරයා එම උපදෙස් අනුව ඉඩම මැන, මැනීමේ ගාස්තු සඳහන් කරන ස්වකීය බිල් පත්‍රත් සමඟ ස්වකීය මුල් පිඹුරත්, ක්ෂේත්‍ර පොතේ, පරීක්ෂා කර බැලීම සඳහා එකී මිනින්දෝරු අධිකාරී වෙත යැවිය යුතුය.

9. (1) ආඥා පනතේ 7 (1) වගන්තිය යටතේ සෑම පැවරීමක්ම මෙයට අනුබද්ධ කර තිබෙන පළමුවන උපලේඛනයෙහි '' ආ '' ආකෘත්ති පත්‍රය අනුව විය යුතු අතර එය මංඩලයේ ලේකම්ට අතින් බාර දීම හෝ ලියා පදිංචි තැපෑලෙන් යැවීම කළ යුතුය.

(2) මංඩලයේ ලේකම් ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරියාගේ පරිපාලනය සහ විනය පාලනය යටතේ ක්‍රියා කළ යුතුය. නින්දගම් ඉඩම් මංඩලයට පැවරුණු හිමිකම් කියා සිටීමේ සෑම ලිඛිත ඉල්ලුම් පතකින්ම පැන නගින කරුණු සම්බන්ධයෙන් ඔහු එම මංඩලයේ සභාපතිගෙන් ලැබෙන විධාන අනුව කටයුතු කළ යුතුය.

(3) හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පතක් පැවරීමක් වශයෙන් ලේකම්ට ලැබුණු විට ඔහු විසින් එය ලියා පදිංචිකර මංඩලයේ සභාපති ඉදිරියේ තැබිය යුතුය.

10. (1) මණ්ඩලය වෙත යොමු කරන ලද හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පතක් පිළිබඳ නිශ්චය කිරීමේ දිනය හා වේලාව සම්බන්ධයෙන් ලේකම් වරයා මණ්ඩලයේ සභාපතිගෙන් උපදෙස් ලබා ගත යුතුය.

(2) ඉක්බිතිව, හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පත පිළිබඳ නිශ්චය කිරීම සඳහා නියම කර ගත් දිනයෙහි එම මණ්ඩලය ඉදිරියෙහි පෙනී සිට සාක්ෂි දෙන ලෙස හෝ යම් යම් ලියවිලි ඉදිරිපත් කරන ලෙස ඒ පාර්ශව කාරයින්ට හා සාක්ෂි කාරයින්ටත් එකී හිමිකම් කියා පෑම බල පෑමට ඉඩ ඇතැයි සැල කෙන සෑම කෙනකුට ද, ලේකම් විසින් සිතාසි නිකුත් කළ යුතුය.

(3) කෙනකුට සිතාසි භාර දීම, අතින් හෝ (එකී තැනැත්තාගේ දැන ගන්නට තිබෙන අන්තිම ලිපිනයට) ලියා පදිංචි කළ තැපෑලෙන් යැවීමෙන් හෝ එම අය අන්තිමට වාසය කළ ස්ථානය හැටියට දැන ගන්නට තිබෙන ස්ථානයේ දොරටුවෙහි සිතාසිය සවි කිරීමෙන් හෝ කළ යුතුය. මණ්ඩලය විසින් නියම කරනු ලබන ප්‍රකාරයට සිතාසි සකස් විය යුතුය.

11. හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පතක් මණ්ඩලයට පවරා ඇති විට එම හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පතෙන් යමෙකුගේ අයිතිවාසිකම්වලට බල පෑමක් සිදු වෙතත්, එම කාරණාවට තමා ද පාර්ශ්ව කරුවකු වශයෙන් ඇතුළත් කර ගන්නා ලෙස මණ්ඩලයෙන් ඉල්ලා සිටීමට එම අය පුළුවන. එබඳු ඉල්ලීමක් කෙරුනු විට එම අය එම කාරණයට පාර්ශ්ව කරුවකු නොකළහොත් එයින් ඔහුගේ අයිතිවාසිකම්වලට අවාසි වන අන්දමේ බල පෑමක් ඇති වෙතැයි එම මණ්ඩලය සෑහීමට පත් වුවහොත් එම ඉල්ලීමට ඉඩ දීමට මණ්ඩලයට පුලුවන.

12. මණ්ඩලය ඉදිරියෙහි පවත්වන යම් සාක්ෂි විභාගයකට පැමිණිය යුතු යම් පාර්ශ්ව කරුවකු ප්‍රමාණවත් හේතුවක් නොදක්වා ඊට නොපැමිණිය හොත් එම සාක්ෂි විභාගය අන් දිනකට කල් දැමීමට හෝ එම පාර්ශව කරුගේ නොපැමිණීම ගැන තැකීමක් නොකොට විභාගය පවත්වා ගෙන යාමට හෝ මණ්ඩලයට පුලුවන.

13. යම් හිමිකම් කියා පෑමක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් දෙන ලද යම් තීරණයක නොහොත් පනවන ලද යම් ආඥාවක ඇති ඕනෑම ලිපි දෝෂයක්, හෝ ප්‍රමාද දෝෂයක් නිදෙස් කිරීමට එම මණ්ඩලයට පුළුවන. එම නිදෙස් කිරීම කරනු ලබන්නේ තීන්දුව නොහොත් තීරණය ගැසට් පත්‍රයෙහි පළ කිරීමෙන් පසුව නම් ඒ නිවැරදි කිරීම ද ගැසට් පත්‍රයෙහි පළ කළ යුතුය.

14. මණ්ඩලයේ සාක්ෂි විභාගයේ දී හිමිකම් කියන ඉල්ලුම් පත ඉදිරිපත් කළ අයට හෝ එම කාරණාව ගැන සැලකිල්ලක් දක්වන අයට, එම මණ්ඩලය විසින් සුදුසු යැයි සිතන පරිදි, තම කරුණු පළමු කොට ඉදිරිපත් කරන ලෙස නියම කළ යුතුය.

15. (1) හිමිකම් කියා සිටීමේ ඕනෑම ඉල්ලුම් පතක් පිළිබඳ මණ්ඩලයේ සෑම තීරණයක්ම ලියවිල්ලක් මගින් විය යුතු අතර සභාපති විසින් එකී තීරණය කියවිය යුතුය.

(2) මණ්ඩලයේ සෑම තීරණයකට පදනම් වූ හේතු එම තීරණයේ සඳහන් විය යුතුය. තවද එවැනි සෑම තීරණයකටම සභාපති අත්සන් තබා තිබිය යුතුය.

16. මණ්ඩලය වෙත කරන ලද යොමු කිරීම් සම්බන්ධයෙන් සාක්ෂි විභාග කොට තීරණයක් කරනු පිණිස එම මණ්ඩලයේ සභාපතිගේ විධානයන් යටතේ මණ්ඩලයේ ලේකම් මණ්ඩල රැස්වීම් කැඳවිය යුතුය.

17. (1) පැවරීමක පාර්ශ්ව කරුවකු ස්වකීය හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පත ඉදිරිපත් කිරීමෙන් පසුව, එහෙත් ඒ පිළිබඳව තීරණයක් දීමට පෙර, මිය ගියහොත් එම මිය ගිය අය වෙනුවට නිශ්චය කළ හැකි තරමින් ඔහුගේ නීත්‍යානුකූල උරුමක්කාරයන් ආදේශ කළ යුතුය.

(2) එසේ ආදේශ කිරීමේ කාර්යය සඳහා මංඩලය ඉදිරියේ පෙනී සිටින ලෙස, මිය ගිය අයගේ උරුමක්කාරයන්ටත්, එම හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පතට අදළ වන නින්දගම් ඉඩමේ එවකට පදිංචිව සිටින හෝ ඒ ගැන සැලකිල්ලක් දැක්වුනු වෙනයම් අයකුට හෝ අයටත් විධි පරිදි කල් තියා දැනුම් දී නියම කිරීමට මංඩලයට පුලුවන.

18. මංඩලය වෙත පවරන ලද හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පතක් ගැන විභාග කොට තීරණය දුන් විට, මංඩලයේ ලේකම් විසින්, හිමිකම් කියා සිටි අයට එම තීරණය වහාම ලියා පදිංචි කළ තැපෑලෙන් දන්විය යුතුය.

19. (1) යම් හිමිකම් කියා සිටින්නෙක් මංඩලයේ තීරණයෙන් සෑහීමට පත් නොවන්නේනම් ආඥා පනතේ 20 වන වගන්තිය යටතේ එකී තීරණයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කළ හැක. එය ඉදිරිපත් කළ යුත්තේ මංඩලයේ තීරණය දන්වමින් ඔහු වෙත එවනු ලබන නොතිසිය ලත් දින සිට තිස් දිනක් ඇතුළතය.

(2) එවැනි සෑම අභියාචනයක්ම අභියාචකගේ අත්සන සහිත ලිඛිත ප්‍රකාශයකින් ඉදිරිපත් කළ යුතු අතර ඊට හේතුද දක්විය යුතුය.

(3) අභියාචන කිරීමේ සෑම ප්‍රකාශයක්ම මෙයට අනුබද්ධ කොට ඇති පළමුවන උප ලේඛනයේ " ඇ " අක්ෂරය දරන ආකෘත්තිය අනුව පිළියෙල කරන ලද්දක් විය යුතුය.

(4) සෑම ඇපැල් ගැනීමේ ප්‍රකාශයක්ම ඉඩම පිහිටි ප්‍රදේශයේ අධිකරණ බලය හිමිවන ප්‍රදේශ අධිකරණයේ ලේකම්ට අභියාචන කිරීමේ කාල සීමාව තුළදී භාර දීම හෝ ලියා පදිංචි තැපෑලෙන් යැවීම හෝ කළ යුතුය.

(5) අභියාචන පෙත්සමක් ප්‍රදේශ අධිකරණයට ලැබුණු විට, එම අධිකරණයේ ලේකම් විසින් ලියවිල්ලකින් මංඩලයේ ලේකම්ගෙන් එම හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පත පිළිබඳ විභාග ලියකියවිලි හෝ විභාග වාර්තාව හෝ ඉල්ලා සිටිය යුතුය. මංඩලයේ ලේකම් එම ඉල්ලීම වහාම ඉටු කළ යුතුය.

20. මංඩලය වෙත කරත ලද යොමු කිරීමක් සම්බන්ධයෙන් මංඩලය විසින් දෙන ලද තීරණයකට විරුද්ධව පනතේ 20(1) දරන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද අභියාචනයක් ලත් ප්‍රදේශ අධිකරණය විසින් එහි අභිමතය පරිදි,

(අ) එම තීරණය ස්ථිර කිරීම ;
(ආ) තීරණය අවලංගු කිරීම ;
(ඇ) තීරණය අවලංගු කොට ඒ වෙනුවට අලුතෙන් විනිශ්චයක් දීම ; හෝ
(ඈ) අවශ්‍ය යයි පෙනෙන පරිදි තීරණය වෙනස් කිරීම හෝ ස්වල්ප වශයෙන් හෝ වෙනස් කිරීම ;
(ඉ) නඩු ගාස්තු ගෙවන ලෙස නියම කිරීම කළ හැකිය.

21. එබඳු සෑම අභියාචනයක්ම පිළිබඳ වූ නඩු විභාග සිවිල් නඩු සංවිධාන සංග්‍රහයේ xxiv වන පරිච්ඡේදයේ නියම කර ඇති පරිදි පෙත්සමකින් ඉල්ලුම් කොට අනුගමනය කෙරෙන සංක්ෂිප්ත ක්‍රම පිළිබඳ වූ විධි විධානවලට යටත් විය යුතුය.

22. අභියාචනයක් සම්බන්ධයෙන් ප්‍රදේශ අධිකරණයෙන් දෙනු ලබන විනිශ්චය, එකී ප්‍රදේශ අධිකරණයේ ලේකම් විසින් මංඩලයේ ලේකම් වෙත වහාම ලියවිල්ලෙන් දැනුම් දිය යුතුය. තවද ඒ අභියාචනයේ කටයුතු සඳහා එම ප්‍රදේශ අධිකරණය විසින් මංඩලයෙන් ලබා ගන්නා ලද ලියකියවිලි ආපසු යැවිය යුතුය.

23. (1) හිමිකම් කියා සිටීමක් සම්බන්ධයෙන් මංඩලය විසින් තීරණය දීමෙන් පසු අභියාචන කිරීමේ කාල සීමාව ඉකුත් වන විටද අභියාචනයක් ඉදිරිපත් කර නොතිබුණහොත් හෝ අභියාචනයක් පිළිබඳ ප්‍රදේශ අධිකරණයේ විනිශ්චය මංඩලයේ ලේකම් වෙත, දන්වා ඇති විට හෝ එම තීරණය හෝ විනිශ්චය හෝ අනුව පනතේ 21(1) වන වගන්තිය යටතේ අයිතිය සම්බන්ධයෙන් තීන්දුවක් දීම සඳහා, මංඩලයේ සභාපති විසින් නියම කරන ලද දිනයක හා වේලාවකදී, මංඩලයේ රැස්වීමක් මංඩලයේ ලේකම් විසින් කැඳවිය යුතුය.

(2) ආඥා පනතේ 21 වගන්තිය යටතේ අයිතිය සම්බන්ධයෙන් දෙනු ලබන එවැනි සෑම තීන්දුවක්ම මෙයට අනුබද්ධ කොට ඇති පළමුවන උප ලේඛනයේ දක්වෙන " ඇ " ආකෘත්ති පත්‍රයට අනුකූල විය යුතු අතර එහි සඳහන් විස්තරද ඇතුළත්ව තිබිය යුතුය.

(3) මංඩලයේ ලේකම් මංඩලයේ එබඳු සෑම රැස්වීමකම වාර්තා ලේඛනයක ලියා තැබිය යුතුයි. රැස්වීමේ කටයුතු අවසානයේදී සභාපති හා එම රැස්වීමට පැමිණ සිටි සාමාජිකයින් එම වාර්තාවට දින යොදා අත්සන් තැබිය යුතුය.

(4) හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පත් පිළිබඳ විභාග පැවැත්වීම සඳහා ව්‍යවස්ථා පැනවීම මංඩලය විසින් කළ හැකිය.

24. (1) ලේඛන ලියා පදිංචි කිරීමේ ආඥා පනත (117 වන අධිකාරය) යටතේ පිහිටුවන ලද ඉඩම් ලියා පදිංචි කිරීමේ සෑම කාර්‍යාලයකම, පනතේ 21 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් දෙන ලද තීන්දු ලියාපදිංචි කිරීම සඳහා නින්දගම් ඉඩම්වල තනි අයිතිකරුවන්ගේ දිස්ත්‍රික් ලේඛනයක් (මින් පසු දිස්ත්‍රික් ලේඛනය නමින් හැඳින්වෙන) වෙනම විවෘත කොට පවත්වා ගෙන යා යුතුය.

(2) එම දිස්ත්‍රික් ලේඛනය රෙජිස්ත්‍රාර් ජනරාල් විසින් තීරණය කරන ලද ආකෘතියකට අනුකූල විය යුතුය.

(3) පනතේ 21 වන වගන්තිය යටතේ හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පතක් පිළිබඳ මංඩලය විසින් දෙන ලද සෑම තීන්දුවක්ම පිටපත් තුනකින් යුක්ත වන සේ පිළියෙල කොට, නින්දගම් ඉඩම සම්පූර්ණයෙන් හෝ එහි වැඩි කොටසක් හෝ පිහිටා ඇති ලියා පදිංචි කිරීමේ දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ත්‍රාර් වෙත එය ලියා පදිංචි කිරීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

(4) හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පතක් පිළිබඳ මංඩල තීන්දුව දිස්ත්‍රික් ලේඛනයේ ලියා පදිංචි කිරීමෙන් පසු තීන්දුවේ පිටපත් දෙකක් ඉඩම් රෙජිස්ත්‍රාර් විසින් මංඩලය වෙත ආපසු යැවිය යුතුය. තවද තුන්වන පිටපත ඔහුගේ කාර්‍යාලයෙහි සටහනක් ලෙස ගොනු කර තබා ගත යුතුය.

25. (1) දිස්ත්‍රික් ලේඛනයේ සටහනක් කරන්නට පෙර, නින්දගම් ඉඩම නැවත මැනිය යුතු යයි ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරියා හෝ නියම බල ධාරියා හෝ අදහස් කරන්නේ නම් අයිතිය පිළිබඳ දෙන ලද තීන්දුවට යටත් වන නින්දගම් ඉඩම එසේ නැවත මැන්නවීමට ඔහුට පුලුවන.

(2) එවැනි මැනීමක සම්පූර්ණ වියදම ආණ්ඩුව විසින් දැරිය යුතුය.

26. මෙම පනතෙන් හෝ පනත යටතේ පනවනු ලබන කිසියම් නියෝගයකින් හෝ තමා වෙත පැවරුණු නොහොත් පැනවුණු යම් බලයක්, රාජකාරියක් නැතහොත් කටයුත්තක් ඉටු කිරීමෙහි යෙදෙන යම් නිලධාරියකුට හෝ තැනැත්තකුට, ඕනෑකමින්ම බාධාකරන්නා වූ, නැතහොත් විරුද්ධ වන්නා වූ කවරකු හෝ මෙම පනත යටතේ වරදකට වරද කරු විය යුතු අතර, ඒ සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් උසාවියක සංෂිප්ත නඩු විභාගයකින් පසුව ඔහු වරදකරු කරනු ලැබුවහොත් රුපියල් පන්සියකට නොවැඩි දඩයකට හෝ තෙමසකට නොවැඩි හිර දඬුවමකට හෝ ඒ දඩය හා හිර දඬුවම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතුය.

27. සභාපතිට හා මංඩලයේ සාමාජිකයන්ට හා මෙයට අනුබද්ධ කොට ඇති දෙවන උප ලේඛනයේ දක්වෙන නිලධාරීන්ට, එම උප ලේඛනයේ එන අදාළ විධි විධානවලට අනුකූලව ගණන් බලා පාරිශ්‍රමික, ගමන් වියදම් දීමනා සහ යැපීම් දීමනා ගෙවිය හැකිය.

28. මෙයට අනුබද්ධ කොට ඇති තුන්වන උප ලේඛනයේ දක්වෙන ගණන් අනුව ගණන් බලා මණ්ඩලය ඉදිරියට කැඳවනු ලබන සාක්ෂි කරුවන්ට බටා සහ ගමන් වියදම් දීමනා ගෙවිය යුතුය.

29. ප්‍රදේශ අධිකරණය විසින් ගෙවන ලෙස නියම කෙරෙන ඕනෑම ගාස්තුවක් සිවිල් නඩුවකදී ගෙවීමට නියම වූ ගාස්තුවක් මෙන් සලකා එය අය කර ගත යුතුය.

30. මේ නියෝගවලදී පද සංයෝජනයෙන් අන්‍යාර්ථයක් අපේක්ෂා කෙරේ නම් මිස—

"පනත" යන්නෙන් 1968 අංක 30 දරන නින්දගම් පනත අදහස් කෙරේ ;

"මණ්ඩලය" යන්නෙන් ඒ පනතේ 8 (1) යන වගන්තිය යටතේ පිහිටුවන ලද නින්දගම් ඉඩම් මණ්ඩලය අදහස් කෙරේ ;

"සභාපති" යන්නෙන් නින්දගම් ඉඩම් මණ්ඩලයේ සභාපති අදහස් කෙරේ ; තවද ඉඩම් හිමිකම් ඉල්ලුම් පත් පිළිබඳ පැවැත්වෙන විභාගයකදී මණ්ඩලයේ සභාපති පැමිණ නොසිටි අවස්ථාවකදී එකී රැස්වීමේ සභාපති ද ඉන් අදහස් කෙරේ ;

"සැලකිල්ලක් දක්වන අය" යන්නට සංස්ථා ගත කළ හෝ නොකළ යම් පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ ;

"රාජකාරි බදු ලේඛනය" යන්නෙන් රාජකාරි බදු ආඥා පනත (467 අධිකාරය) යටතේ පිළියෙළ කරන ලද රාජකාරි බදු ලේඛනය අදහස් වේ සහ

"ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරියා" යන්නට අතිරේක ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරියෙක් ද ඇතුළත් වේ.

## පළමුවන උපලේඛනය

### "අ" ආකෘතිය

### 1968 අංක 30 දරණ නින්දගම් පනත

අයිතිය සම්බන්ධයෙන් වූ තීන්දුවක් සඳහා පනතේ 6 (1) වෙනි වගන්තිය යටතේ හිමිකම් කියා සිටීමේ ලිඛිත ඉල්ලුම් පත.

කොළඹ, නින්දගම් ඉඩම් මණ්ඩලය වෙතටයි,

(නියම බලධාරියා වන......................................................................හි ආණ්ඩුවේ ඒජන්ත මගිනි.)

[..........................................................................හි පදිංචි ..................................................................................................

වන මම, මෙම හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පතේ සඳහන් වන නින්දගම් ඉඩම් සම්බන්ධයෙන් 1968 අංක 30 දරණ නින්දගම් ඉඩම් පනතේ 21 වෙනි වගන්තිය යටතේ තීන්දුවක් ලබා දෙන ලෙස මා වෙනුවෙන් ............................................................................හි පදිංචි ...................... ...........................................................................................ගේ ආරක්ෂකයා කළමනාකරු/වශයෙන් ඔහු/ඇ වෙනුවෙන් මෙයින් ඉල්ලා සිටිමි.

2. එවැනි සහතිකයක් නිකුත් කිරීමට පෙර ඉඩම මනින්නට සිදු වුවහොත් ඒ සඳහා අක්කරයකට රු. 15 කට වැඩි නොවන පරිදි ගණන් බැලූ වියදම් වලින් කොටසක් දැරීමට මම පොරොන්දු වෙමි.

3. ............................................................................ හි පදිංචි .................................................................................................. ගේ ආරක්ෂකයා/කළමනාකරු වශයෙන් මගේ පත්වීමේ සහතිකය මීට යා කොට ඇත.

4. මෙම හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පත සලකා බැලීම සඳහා ද එය පිළිබඳ තීරණයක් දීම සඳහා ද අවශ්‍ය විස්තර පහත දක්වෙයි. මෙම විස්තර මගේ හොඳම දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බවත්, නිවැරදි බවත් ප්‍රකාශ කරමි.

.....................................................................
හිමිකම්පාන්නා/ආරක්ෂක/කළමනාකරු.

දිනය : ..................................................................

* නොගැලපෙන කොටස් කපා දමන්න.

| | |
|---|---|
| (අ) ඉල්ලුම් පත ඉදිරිපත් කරන හිමිකම් පාන්නාගේ*/ආරක්ෂකයාගේ*/ කළමනාකරුගේ නම සහ ලිපිනය : | |
| (ආ) හිමිකම් කියා සිටීමේ ඉල්ලුම්පත ඉදිරිපත් කරනු ලබන්නේ කවුරුන් වෙනුවෙන් ද ඔහුගේ*/ඇගේ සම්පූර්ණ නම සහ ලිපිනය : | |

| | |
|---|---|
| (ඇ) නින්දගම් ඉඩමෙහි නම සහ ප්‍රමාණය සහ 1968 ජූනි මස 22 වෙනි දින එය කාගේ බුත්තියේ තිබුණේ ද යන වග : | |
| (ඈ) නින්දගම් ඉඩමෙහි මායිම් විස්තර :—<br>උ :<br>නැ :<br>ද :<br>බ : | |
| (ඉ) තිබෙන වගාවෙහි සහ ගොඩනැගිලි ආදියෙහි ස්වභාවය සහ වයස : | |
| (ඊ) නින්දගම් ඉඩමෙහි පිහිටීම (දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශය, ග්‍රාම සේවක කොට්ඨාශය සහ ගම) : | |
| (උ) පිඹුරු යමක් තිබේ නම් ඒවා පිළිබඳ විස්තර (එබඳු යමක් ඇත්නම් එහි පිට ලස් සටහනක් හෝ කටු සටහනක් අමුණන්න) : | |
| (ඌ) ඔප්පු තිබේ නම් ඒවායේ විස්තර : | |
| (එ) දන්නේ නම්, දිස්ත්‍රික්ක රාජකාරි බද්දු ලේඛනයේ සඳහන් වන පරිදි පංගුවෙහි අංකය : | |
| (ඒ) දන්නේ නම්, දිස්ත්‍රික්ක රාජකාරි බද්දු ලේඛනයේ සඳහන් වන පරිදි පංගුවෙහි නම : | |
| (ඔ) මාරු වන පංගුවක් ද, ප්‍රවේණි පංගුවක් ද යන වග : | |
| (ඕ) දන්නේ නම් දිස්ත්‍රික්ක රාජකාරි බද්දු ලේඛනයේ සඳහන් වන පරිදි අයිතිකරුගේ සම්පූර්ණ නම සහ ලිපිනය : | |
| (ක) දන්නේ නම්, දිස්ත්‍රික්ක රාජකාරි බද්දු ලේඛනයේ සඳහන් වන පරිදි අඳ ගොවියාගේ හෝ දරන්නාගේ සම්පූර්ණ නම : | |
| (ග) දන්නේ නම්, මුලින් කළ යුතුව තිබුණු රාජකාරියෙහි ස්වභාවය හෝ ඒ වෙනුවට මුදලක් ගෙවනු ලැබේ නම් මුදල කොපමණද යන වග : | |

* නොගැලපෙන කොටස් කපා හරින්න.

| | |
|---|---|
| (ඡ) දූන් කියා සිටින හිමිකමේ පදනම සහ එහි සවභාවය : | |
| (ට) අවශ්‍ය වුවහොත් හිමිකම් කියා සිටින්නා විසින් විභාගයේදී සාක්ෂියට කැඳවීමට බලාපොරොත්තු වන සාක්ෂි කරුවන්ගේ සම්පූර්ණ නම් සහ ලිපිනයන් : | |
| (ඩ) හිමිකම් ඔප්පු කිරීම සඳහා ඉල්ලුම්කරු පදනම් කර ගන්නා ලියවිලි පිළිබඳ විස්තර : | |
| (ණ) පෙළපත් සටහන (එය ඇමිණිය යුතුයි.) : | |

* නොගැලපෙන කොටස් කපා දමන්න

"ආ" ආකෘතිය

**1968 අංක 30 දරන නින්දගම් පනත**

නින්දගම් මංඩලය වෙතටයි, කොළඹ.

හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පතක් පැවරීම : අංකය

1968 අංක 30 දරන නින්දගම් පනතේ 21 වන වගන්තිය යටතේ අයිතිය සම්බන්ධයෙන් තීන්දුවක් ලබා ගැනීම සඳහා ........................................ ..............................................................................හි පදිංචි ..........................................................මහතා/මහත්මිය විසින් 6(1) වෙනි වගන්තිය යටතේ හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පතක් ඉදිරිපත් කර ඇති හෙයින්, යථෝක්ත පනතේ විධි විධාන යටතේ ද එකී පනත යටතේ පනවා ඇති නියෝග අනුව ද එම හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පත විභාග කර තීන්දුවක් දීම සඳහා මම එය නින්දගම් මංඩලයට මෙයින් පවරමි.

2. මෙම විභාගය ..................................................පරිපාලන දිස්ත්‍රික්කයේ .............................................. දී පැවැත් විය යුතුය.

3. පහත දක්වෙන ලියවිලි මීට අමුණා ඇත :
   (i) ඉදිරිපත් කර ඇති හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පත;
   (ii) ඉල්ලුම් පතේ සඳහන් වන ඉඩමේ කටු සටහන හෝ පිටලස් සටහන;
   (iii) පෙළපත් සටහන ;
   (iv) දිස්ත්‍රික්ක රාජකාරි බදු ලේඛනයෙහි දක්වෙන පරිදි, ඉහත සඳහන් ඉඩමට අදාළ වන සටහනේ සහතික කළ පිටපත.

4. හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පත නියමිත කාල සීමාව ඇතුළත ඉදිරිපත් කරන ලදී.

.........................................
නියම බලධාරියා

.........................................
පාලන දිස්ත්‍රික්කය

දිනය ......................................

"ඇ" ආකෘති පත්‍රය

1968 අංක 30 දරන නින්දගම් පනත. (පනතේ 20 (1) වගන්තිය යටතේ ප්‍රදේශ අධිකරණයට අභියාචනය කිරීම).

අභියාචන පෙත්සම

..............................................................................................ප්‍රදේශ අධිකරණයේදී ය. අභියාචක වන .................

..............................................................................................ගේ අභියාචන පෙත්සමයි.

ලිපිනය :..............................................................................................

එදිරිව

කොළඹ, නින්දගම් මංඩලය, වග උත්තරකරු.

..............................................................................................පරිපාලන දිස්ත්‍රික්කයේ නියම බලධාරියා වග උත්තරකරු.

.............................................................................................. කාරණාව ගැන

ගෞරව පුරස්සව .............................................................................................. අධිකරණය වෙත ඉහත

නම් සඳහන් වන අභියාචක විසින් පහත දැක්වෙන පරිදි සැළකර සිටිනු ලැබේ :—

මෙම අභියාචනයට පදනම් වූ තීරණයෙහි පිටපතක් මීට අමුණා ඇත. එබැවින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් තීරණයක් කරන ලෙස අභියාචක විසින් උසාවියට ආයාචනා කර සිටිනු ලැබේ:—

1.

2.

3.

4.

..........................................
අත්සන.

ලිපිනය :

දිනය :

19..............................................................................................වන මෙදින ..............................................................................................

..............................................................................................දී අභියාචක විසින් ඉහත සඳහන් ලේඛනය මා ඉදිරියෙහි අත්සන් කළ බවට ..............................................................................................

..............................................................................................පදිංචි සමාදාන විනිශ්චයකාර ..............................................................................................

..............................................................................................වන මම මෙයින් සහතික කරමි.

..........................................
අත්සන:
සමාදාන විනිශ්චයකරු

ලිපිනය :

අභියාචක විසින් අභියාචනය අත්සන් කරන්නේ ආරක්ෂක*/ කළමනාකරු වශයෙන් නම් ඒ බව සඳහන් කොට තමා එසේ ක්‍රියා කරන්නේ කවරකු වෙනුවෙන් ද යන වග සඳහන් කළ යුතුය.

*අනවශ්‍ය කොටස් කපා දමන්න.

"ඇ" ආකෘති පත්‍රය

1968 අංක 30 දරන නින්දගම් පනත

ප්‍රදානය

තමා වෙනුවෙන්* / ................................................. හි පදිංචි .............................................................ගේ ආරක්ෂක *කළමනා

කරු*වශයෙන් ............................................................................ හි පදිංචි ..................................................විසින්

මීට අඩංගු කොට ඇති උප ලේඛනයෙහි පළමුවන තීරුවෙහි විස්තර දක්වා තිබෙන නින්දගම් ඉඩම සම්බන්ධයෙන් ඉහත සඳහන් අඥ පනතේ 6(1) වගන්තිය යටතේ හිමිකම් කියා සිටීමේ ලිඛිත ඉල්ලුම් පතක් ඉදිරිපත් කරන ලදුව එකී නින්දගම් ඉඩමේ අයිතිය පිළිබඳ තීරණයක් ලබා ගැනීම පිණිස ඉහත ප්‍රකාශිත ආඥ පනතේ 21(1) වගන්තිය යටතේ දිස්ත්‍රික්කයේ නියම බලධාරියා විසින් එකී ඉල්ලුම් පත නින්දගම් ඉඩම් මංඩලය වෙත පවරා ඇති බැවින් ද,

එකී පැවරීම නිසි පරිදි සලකා බලා ඉහත ප්‍රකාශිත මංඩලය විසින් දෙන ලද තීරණය ඉහත සඳහන් ආඥ පනතේ 19(2) වගන්තිය අනුව අවසාන හා තීරණාත්මක වී ඇති බැවින් ද, එකී මංඩලය මගින් දෙන ලද තීරණයට විරුද්ධව .............................................................................. ප්‍රදේශ අධිකරණයට කරන ලද අභියාචනයේ අවසාන තීන්දුව ලැබී ඇති බැවින් ද,

දැන් ඉන් නිසා, 1968 අංක 30 දරන නින්දගම් පනතේ 21) (1) වගන්තියෙන් නින්දගම් ඉඩම් මංඩලයට පැවරෙන බලතල යටතේ එකී අවසාන වූ හා තීරණාත්මක වූ තීන්දුව එකී ප්‍රදේශ අධිකරණයේ අවසාන තීන්දුව අනුව, එනම්............................................................................................ මෙයට අඩංගු කොට ඇති උප ලේඛනයෙහි දෙවෙනි තීරුවෙහි නම් සඳහන් වන අය ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති බිම් කොටස්වල එකී උප ලේඛනයෙහි තුන්වැනි තීරුවෙහි දක්වා ඇති බැඳීම්වලට හැර අන් කිසිම බැඳීමකට භාජනය නොවන පරිදි එකී උප ලේඛනයෙහි පළමුවන තීරුවෙහි විස්තර වන නින්දගම් ඉඩමේ තනි අයිතිකරුවන් වශයෙන් එකී මණ්ඩලය විසින් ප්‍රකාශ කරනු ලැබේ. තවද, අන්සෑම කෙනෙකුගේ අයිතිවාසිකම් ඉවත්ව එකී ඉඩම හෝ ඉඩමේ එකී කොටස හෝ එකී අයවලුන් මත ස්ථිරවම පවරනු ලැබේ.

උපලේඛනය

| 1 වන තීරුව<br>නින්දගම් ඉඩමේ විස්තරය | 2 වන තීරුව<br>තනි අයිතිකරුවන්ගේ නාම සහ ලිපිනයන් | 3 වන තීරුව<br>හිමිවන බෙදූ හෝ නොබෙදූ හෝ කොටස් බැඳීම් යමක් ඇතහොත් ඒවා. |
|---|---|---|
| ........................................................................ | 1 ..........................................පදිංචි | |
| පරිපාලන දිස්ත්‍රික්කයේ ...................................... | ..................................................................... | |
| ආදායම් පාලක කොට්ඨාශයේ.......................... | 2 .......................................... පදිංචි | |
| ........................................................................ | ..................................................................... | |
| ග්‍රාම සේවක කොටසේ ...................................... | | |
| ............................. පිහිටියා වූත්, ප්‍රමාණයෙන් | | |
| අ. රූ. ප. වූත් උතුරෙන් .........................ද | | |
| නැගෙනහිරින් .............................................. ද | | |
| දකුණින් ........................................................ ද | | |
| බස්නාහිරින් ...............................................ද | | |
| මායිම් වූත් .................................................නම් | | |
| නින්දගම් ඉඩම නොහොත් .............................. | | |
| විසින් පිළියෙළ කොට .................................. | | |
| වන දින යොදා ඇති අංක .............................. | | |
| දරන පිඹුරෙහි අංක ........................................ | | |
| දරන බිම් කට්ටිය ලෙස වඩා නිශ්චය වශයෙන් විස්තර කර ඇති ඉඩම. | | |

19..............................................................................වන මෙදින ම විසින් අත්සන් කරන ලදි.

..........................................................................

නින්දගම් ඉඩම් මංඩලයේ සභාපති.

* නොගැලපෙන කොටස් කපා හරින්න.

### දෙවන උප ලේඛනය

1. නින්දගම් මංඩලයේ සෑම සාමාජිකයෙක්ම ඔහු රජයේ නිලධාරියෙක් නොවේ නම්, මෙහි මින් මතු දක්වා ඇති විධි විධානවලට යටත්ව, හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පතක් පිළිබඳ පැවැත්වනු ලබන ඕනෑම විභාගයකට හෝ මංඩලයේ ඕනෑම රැස්වීමකට සහභාගි වූ සෑම වාරයකටම :

(I) රැස්වීම පැවැත්වූ කාල සීමාව පැය දෙකකට වැඩි නොවේ නම්, එවැනි සෑම රැස්වීම් වාරයකටම රු. 50 බැගින් ද,

(II) රැස්වීම් පැවැත්වූ කාලය පැය දෙකකට වැඩි නම්, එවැනි සෑම රැස්වීම් වාරයකටම රු. 75 බැගින් ද ගණන් බැලූ ගාස්තුවක් ලැබීමේ හිමිකම් ලැබිය යුතුය.

එතකුදු වුවත් හිමිකම් කියා පෑමේ එක ඉල්ලුම් පතක් විභාග කිරීම සම්බන්ධයෙන් පැවැත්වුනු රැස්වීම් වාරවලට පැමිණීම වෙනුවෙන් මංඩලයේ සාමාජිකයෙකුට ගාස්තු වශයෙන් ලැබිය හැකි උපරිම ප්‍රමාණය රු. 100 කට වැඩි නොවිය යුතුය.

2. මංඩලයේ සාමාජිකයන් විසින් තමන්ගේ රාජකාරි ඉටු කිරීම සඳහා කරන ගමන් වෙනුවෙන් පහත දක්වෙන විධි විධානයන් අනුව ගණන් බැලූ ගමන් වියදම් දීමනාවන්ට හිමිකම් ලැබිය යුතුය.

(අ) යම් ගමනක් හෝ ගමනකින් කොටසක් එතරම් අපහසුවක් නොමැතිව දුම්රියෙන් යාහැකිව තිබුණේ නම්, ඒ වෙනුවෙන් පළමු වන පංතියේ දුම්රිය ගමන් බල පත්‍රිකා වටිනාකමට සමාන ගමන් වියදම් ගාස්තුවක් ලැබීමට සාමාජිකයකුට හිමිකම තිබිය යුතුය.

(ආ) දුම්රියෙන් යැම එතරම් පහසුවෙන් කළ නොහැකි ගමනක් හෝ ගමනකින් කොටසක් පෞද්ගලික හෝ කුලී රථයකින් ගිය විට එසේ ගිය දුර ප්‍රමාණය වෙනුවෙන් සැතැප්මකට හෝ ඉන් ඉතිරි කොටසකට ගමන් ගාස්තු වශයෙන් ශත 50 ක් බැගින් ලැබීමට සාමාජිකයකුට හිමිකම තිබිය යුතුය.

(ඇ) බසයකින් හෝ එවැනි පොදු වෙනත් වාහනයකින් ගිය ගමනක් වෙනුවෙන් යම් සාමාජිකයකු විසින් ගමන් ගාස්තුව වශයෙන් නියම වශයෙන් ම ගෙවූ මුදල ලැබීමට ඔහුට හිමිකම තිබිය යුතුය.

3. රජයේ සේවකයන්ට එම ගමන් වෙනුවෙන් ආණ්ඩුවේ මුදල් නියෝගවලින් තමන්ට අදළ වන නියෝගවල විධිවිධානයන් අනුව ගණන් බැලූ ගමන් ගාස්තු සහ යැපීම් දීමනා ලැබීමට හිමිකම් තිබිය යුතුය.

### තුන්වන උප ලේඛනය

ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරියාගේ හෝ නින්දගම් මංඩලයේ හෝ ඉල්ලීම උඩ සාක්ෂකරුවන් වශයෙන් කැඳවනු ලබන ආණ්ඩුවේ නිලධාරීන්ට ආණ්ඩුවේ මුදල් නියෝග අනුව යැපීම් දීමනා සහ ගමන් වියදම් දීමනා ගෙවිය යුතුය.

2. (1) ආණ්ඩුවේ සේවකයන් නොවන සාක්කිකරුවන්ට පහත සඳහන් ප්‍රමාණ අනුව ගෙවිය යුතුය :—

| 1 | 2 | 3 | | | 4 |
|---|---|---|---|---|---|
| පංතිය | දිනකට බටා | ගමන් වියදම් දීමනාව | | | වක්‍රය |
| | | (අ) දුම්රියෙන් හෝ බස්රියෙන් හැර වෙනක් වාහනයකින් | (ආ) දුම්රියෙන් | (ඇ) බස්රියෙන් | පුද්ගලයින්ගේ ආදායම |
| | රු. ශ. | ශ. | | | |
| 1 ... | 10 00 ... | 45 ... | 1වෙනි පංතියේ ගාස්තුව ... | දරු නියමිත ගාස්තුව ... | 1වෙනි පංතිය අවුරුද්දකට රු. 6000 ක් සහ ඊට වැඩි |
| 2 ... | 7 00 ... | 35 ... | එම ... | එම ... | දෙවන පංතිය අවුරුද්දකට රු. 3,600 ට වැඩි සහ රු. 6,000 ට අඩු |
| 3 ... | 3 50 ... | 25 ... | දෙවන පංතිය ... | එම ... | තුන්වන පංතිය අවුරුද්දකට රු. 1,500 ට වැඩි රු. 3,500 ට අඩු |
| 4 ... | 2 50 ... | 20 ... | එම ... | එම ... | හතරවන පංතිය අවුරුද්දකට රු. 1,500 අඩු |

(2) ඉහත සඳහන් වන ගාස්තු ප්‍රමාණ අනුව බටා සහ ගමන් ගාස්තු ගණන් බැලිය යුත්තේ සැතපුම් කුලියත් ඇතුලුව යැපීම් දීමනා සහ ගමන් ගාස්තු වියදම් දීමනා සඳහා ආණ්ඩුවේ මුදල් නියෝගවල දක්වා ඇති ක්‍රමයටය.

3. හිමිකම් කියා සිටීමේ ඉල්ලුම් පතක් ඉදිරිපත් කළ අයකු විසින් කැඳවූ සාක්ෂි කාරයින්ට බටා සහ ගමන් වියදම් ගෙවීමට අවශ්‍ය මුදල එම සිතාසි නිකුත කිරීමට පෙර එකී හිමිකම් කියා සිටින්නා විසින් නින්දගම් ඉඩම් මංඩලයේ ලේකම් වෙත තැන්පත් කරකිබේ නම්, එම සාක්ෂි කාරයින්ට ඉහත සඳහන් කළ 2(1) සහ 2(2) වන නියෝග අනුව එම ගාස්තු ගෙවිය යුතුය.

4. එම ගාස්තු ගෙවීමට බලය ලත් නිලධාරියා වනුයේ, අදළ පරිදි, ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරියා හෝ නින්දගම් ඉඩම් මංඩලයේ ලේකම්ය.

5. එවැනි සෑම ගෙවීමක්ම, නින්දගම් ඉඩම් මංඩලය විසින් නිකුත් කළ පැමිණීමේ සහතිකයක් උඩ හෝ ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරියා විසින් නිකුත් කරන ලද විශේෂ සහතිකයක් උඩ හෝ කළ යුතුය.

10–985

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රපිතයි.